(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 166.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 පෙබරවාරි මස 10 වැනි සිකුරාදා අ. භා. 1.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1306/’11

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ 10 තුළ වාර්ෂික පදනමින් රටට ලැබුණු මුළු ප්‍රේෂණ ප්‍රමාණය ඇමරිකානු ඩොලර් සහ ශ්‍රී ලංකා රුපියල්වලින් කොපමණද;

(ii) එම ප්‍රේෂණ ලැබුණු රටවල නම් කවරේද;

(iii) පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී ඉහත සඳහන් එක් එක් රටවලින් එක් පුද්ගලයකුට ලැබුණු සාමාන්‍ය ප්‍රේෂණ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) අපේ විදේශ සංචිත ආරක්ෂා කර ගැනීමට උපකාරීවන පුරවැසියන්ට ලබාදෙන ප්‍රතිලාභ කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1493/’11

2.

ගරු අජිත් කුමාර මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම් එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1567/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අම්පාර දිස්ත්‍රික්කයට අයත්, මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මහඔය සිට පොල්ලේබැද්ද දක්වා මාර්ගය සම්බන්ධ කරමින් ඉදිකර ඇති යකඩ පාලම දිරාපත්ව, අබලන් වී ඇති බැවින් ජන ජීවිත දැඩි අවදානමට ලක්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාලමේ ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනමින් ආරම්භ කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1612/'11

4.

ගරු ඊ. සරවනපවන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යාපනය මහනගර සභාවේ නගරාධිපති, සභාවේ අනුමතියකින් තොරව අත්තනෝමතික තීරණ ගනිමින්, යාපනය නගරයේ වගුරුබිමක සිව්මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයෙකුට අනුමතිය ලබාදී ඇති බවත්;

(ii) යාපනයේ හිටපු පුරපති දිවංගත රවිරාජ් මහතා එම වගුරුබිමෙහි මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කළ යෝජනාවක් පස් පිළිබඳ සිදු කළ ශක්‍යතා වාර්තාවේ නිර්දේශ හේතුවෙන් ක්‍රියාත්මක නොකළ බවත්;

(iii) කිසිදු පස් පරීක්ෂාවකින් තොරව එම වගුරුබිමෙහි මේ වන විට සිව්මහල් ගොඩනැගිල්ලක් ඉදිකරනු ලබන බවත්;

(iv) එම ඉදිකිරීම පසුකාලීනව ජීවිත හා දේපළ හානි සිදුවීමට හේතුවිය හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගොඩනැගිල්ල ඉදිකිරීමටත් පෙර ඉදිකිරීම්කරු කඩ කාමර කිහිපයක් විකුණා ඇති බවත්;

(ii) එහිදී රු. 19,000,000කට විකුණනු ලැබූ කඩ කාමරවලට රු. 11,000,000කට පමණක් ඔප්පු ලියා අත්තිකාරම් වශයෙන් රු. 50,000 බැගින් ලබාගෙන ඇති බවත්;

(iii) එමගින් මහනගර සභාවට ආදායම අහිමිවීමක් හා ආදායම් බදු වංචාවක් සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත තත්ත්වය වැළැක්වීමට මූලික පරීක්ෂණයක් පවත්වා නිසි පියවර ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1694/'11

5.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා පුත්‍ර බැංකුව පිහිටුවීමේ අරමුණ කුමක්ද;

(ii) එම බැංකුව පිහිටුවනු ලැබූ දිනයේ සිට මේ දක්වා ණය ලබා දී තිබෙන පුද්ගලයින් සංඛ්‍යාව හා ණය ප්‍රමාණය කොපමණද;

(iii) 2011 වර්ෂය දක්වා ණය ආපසු අය කර ගැනීමේ ප්‍රතිශතයන් කවරේද;

(iv) මිලියන 50ට වැඩි, මිලියන 100ට වැඩි හා මිලියන 200ට වැඩි වටිනාකමින් යුත් ණය ලබා දෙන ලද පුද්ගලයින් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1720/'11

6.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා වෙනුවෙන් පත්කොට ඇති ක්‍රියාකාරී අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජිකයින් කවුරුන්ද;

(ii) එම ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් පත්කරන ලද බලධාරියා කවුරුන්ද;

(iii) ක්‍රියාකාරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(iv) එම එක් එක් ක්‍රියාකරී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකථන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1861/'11

7.

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඩෙංගු මර්දනය සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා විසින් වවුනියාව නගර සභාවට 2009 වර්ෂයේදී වෙන්කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කිරීමට අදාළ ගිණුම් වාර්තා හා විස්තර මෙතෙක් නගර සභාවට ඉදිරිපත් නොකිරීමට හේතුව කවරේද;

(iii) එම ගිණුම් වාර්තා හා විස්තර නගර සභාවට ඉදිරිපත් කරවීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1874/'11

8.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුලියාපිටිය නගරයේ පිහිටා ඇති ලංකා විදුලිබල මණ්ඩලයේ, වයඹ පළාත් කාර්යාලයට අයත් තුන්මහල් ගොඩනැගිල්ලෙහි ඉඩ ප්‍රමාණය වර්ග අඩි කොපමණද;

(ii) එම ගොඩනැගිල්ලේ කාර්යාල කටයුතු සඳහා පමණක් භාවිතා කරන ඉඩ ප්‍රමාණය කොපමණද;

(iii) අදාළ ගොඩනැගිල්ල තුළ කාර්යාල කටයුතු සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් තිබියදී එම ගොඩනැගිල්ල ඉදිරිපිට ඇති වෙනත් ගොඩනැගිල්ලක් සඳහා වැඩිපුර මුදල් ගෙවමින් විදුලිබල මණ්ඩලය විසින් කුලියට ලබා ගැනීමට හේතුව කවරේද;

(iv) කුලියාපිටිය මැතිවරණ කොට්ඨාසය තුළ ලංකා විදුලිබල මණ්ඩලය මගින් කුලී හෝ බදු පදනම මත ලබා ගෙන ඇති වෙනත් ගොඩනැගිලි කවරේද;

(v) පසුගිය වර්ෂ තුනක කාලය සඳහා එම එක් එක් ගොඩනැගිල්ල වෙනුවෙන් ගෙවනු ලැබූ කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1910/'11

9.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අමාත්‍යාංශයේ ලේකම් එම්. එස්. මොහොමඩ් මහත්මිය 2011 මැයි හා ජූනි මාසවල ලැබූ වැටුප් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මොහොමඩ් මහත්මිය 2011 සැප්තැම්බර් මාසයේදී ලබා ගත් වැටුප කොපමණද;

(iii) 2011 වර්ෂය තුළ ලේකම්වරියගේ වැටුප් වර්ධක වැඩි කරගෙන තිබේද;

(iv) අමාත්‍යාංශයේ ලේකම්වරියගේ රියදුරාට 2011 වර්ෂය තුළ වැටුප් වර්ධක ලබා දී තිබේද;

(v) එසේ නම්, ලබා දී ඇති වැටුප් වර්ධකවල වටිනාකම කොපමණද;

(vi) එම වැටුප් වර්ධක ලබාදී වැටුප් වැඩි කර ඇති පදනම කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1915/'11

10\.
ගරු අජිත් පී. පෙරේරා මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2005, 2006, 2007, 2008, 2009 සහ 2010 වර්ෂවලදී ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල වෙතින් උපාධි ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම උපාධිධාරීන් අතරින් අභ්‍යන්තර ශිෂ්‍යයන් හා බාහිර ශිෂ්‍යයන් වශයෙන් උපාධි ලබාගත් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) බාහිර උපාධි පාඨමාලා පිළිබඳ රජයේ ප්‍රතිපත්තිය කුමක්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1990/'11

11\.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ, වියලුව ප්‍රදේශයේ පිහිටි ගලඋඩ නමැති ගම්මානයට මේ දක්වා නළ ජල පහසුකම් ලබා නොදීම හේතුවෙන් එම ප්‍රදේශයේ ජනතාව දැඩි දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බවත්;

(ii) නළ ජල සැපයුමක් ලබාදී තම පානීය ජල අවශ්‍යතාවය සපයා දෙන ලෙස ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ බණ්ඩාරවෙල ශාඛාව වෙත එම ප්‍රදේශයේ ජනතාව විසින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ගලඋඩ ප්‍රදේශයේ ජීවත්වන 200 කට අධික පවුල්වලට අවශ්‍ය පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා නළ ජල පහසුකම් සපයාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2001/'11

12\.
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බුත්තල නගරයේ ඉදිකර ඇති නව ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පිහිටි වෙළඳ කුටි 17න් ධීවර සංස්ථාවට වෙන්කළ අංක 11 දරන වෙළඳ කුටිය හැරුණු කොට, අංක 4 සිට 17 දක්වා වෙළඳ කුටි සියල්ලම ටෙන්ඩර් කැඳවා එක් වෙළඳ කුටියක් රුපියල් ලක්ෂ 20ක පමණ මුදලකට ලබාදුන් බවත්;

(ii) අංක 1, 2 සහ 3 යන වෙළඳ කුටි සභාවේ අනාගත අවශ්‍යතාවයන් සඳහා යෙදවීම පිණිස ටෙන්ඩර් මගින් ලබා නොදීමට මාසික සභා රැස්වීමේදී තීරණයකට එළැඹි බවත්;

(iii) පසුව එම වෙළඳකුටි තුන වෙනුවෙන් තම හිතවතුන් ඉදිරිපත් කළ එක් වෙළඳ සැලකට රුපියල් ලක්ෂ 10ක් වැනි අවම වටිනාකමින් යුත් ටෙන්ඩර්පත් පිළිගෙන ඇති බවත්;

(iv) විනිවිදබවින් තොරව සිදුකරන ලද ඉහත ටෙන්ඩර් කැඳවීම තුළින් එම ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමිවී ඇති බවත්;

(v) එම අයථා ටෙන්ඩර් කැඳවීම තුළින් විශාල මූල්‍ය වංචාවක් සිදුවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ටෙන්ඩර් කැඳවීම සම්බන්ධයෙන් අපක්ෂපාතී පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2042/'11

13\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී,

(i) සමෘද්ධි වැඩසටහන යටතේ සමෘද්ධි සහනාධාරය ලබාදීම සඳහා වැයකළ මුදල;

(ii) මුළු රටේම සමෘද්ධි සහනාධාරය ලැබූ පවුල් සංඛ්‍යාව;

(iii) සමෘද්ධි ව්‍යාපාරයේ නියාමකවරුන් ලෙස සේවය කළ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව;

(iv) සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ගේ වැටුප් සහ දීමනා ගෙවීම වෙනුවෙන් වැය කළ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2057/'11

14\.
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ දෙක තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් කොළඹ කොටස් වෙළඳපොලේ සිදුකරන ලද සියලුම ලැයිස්තුගත කොටස් මිලදී ගැනීම් හා විකිණීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එක් එක් ගනුදෙනුව සඳහා වගකීම දැරූ තැරැව්කරුවන්ගේ නම් කවරේද;

(iii) තැරැව්කරු ගාස්තු ද ඇතුළුව එක් එක් ගනුදෙනුවට අදාළ පිරිවැය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ඉහත සඳහන් වර්ෂ දෙකක කාල පරිච්ඡේදය සඳහා එක් එක් කොටස් තැරැව්කාර සමාගමට ගෙවන ලද තැරැව්කාර ගාස්තු ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එක් එක් මිලදී ගැනීමට හෝ විකිණීමට සති දෙකකට පෙර සහ මිලදී ගැනීමෙන් හෝ විකිණීමෙන් සති දෙකකට පසු ඉහත (අ) (i) හි සඳහන් එක් එක් කොටසෙහි ඇවුරුම් මිල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2066/’11

15.

ගරු ඒ. විනායගමූර්ති මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාවේ, තච්චන්කුලම්හි පිහිටි බස්තියම්පිල්ලේ ජෝසප් පීටර් මහතාට අයත් අක්කර දහයක වපසරියක් ඇති “පීටර්ස් ෆාම්” නැමති ගොවිපල [අංක 7 එස්. පී. 4739 දරන පිඹුරේ ලොට් අංක 797 ලෙස සඳහන් වන] වවුනියා ගුවන්තොටුපළ පුළුල් කිරීම සඳහා 1986දී අත්පත් කරගත් බවත්;

(ii) 1986දී අත්පත් කරගත් එම ඉඩම සඳහා ගෙවිය යුතු වන්දි මුදල මේ දක්වා ගෙවා නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) බස්තියම්පිල්ලේ මහතා මියගොස් ඇති බැවින් ඉහතකී වන්දි මුදල ඔහුගේ බිරිඳ සහ දියණිය වෙත ගෙවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

### ශෝක ප්‍රකාශ යෝජනා

1.

අභාවප්‍රාප්ත ගරු ෂෙල්ටන් රණරාජ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

2.

අභාවප්‍රාප්ත ගරු එච්. එම්. ඩී. බී. හේරත් මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී

---

## ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 116 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 7/’10

1.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100 කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/'10

2.

ගරු රවී කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 9/'10

3.

ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/'10

4.

ගරු රවී කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/'10

5.

ගරු රවී කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'10

6.

ගරු රවී කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'10

7.

ගරු රවී කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'10

8.

ගරු රවී කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'10

9.

ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/'10

11.

ගරු රවී කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් ස්ථාපිත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා "තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'10

12.

ගරු රවී කරුණානායක මහතා,— "විශේෂ නඩු පවරන නිලධාරී" නමැති තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ නඩු පවරන නිලධාරී" නමින් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'10

13.

ගරු රවී කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'10

14.

ගරු රවී කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'10

15.

ගරු රවී කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'10

16.
ගරු රවි කරුණානායක මහතා,— අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටුවීම,— සාමය කඩවීම වැනි ජාතික ප්‍රශ්නයක් ඇති ශ්‍රී ලංකාව බහු ජාතික හා බහු ආගමික රටක් වන හෙයින්, ශ්‍රී ලංකාව තුළ, කලාපය තුළ හා සමස්ත වශයෙන් ලෝකයේම එවැනි ප්‍රශ්න විසඳීම සඳහා බෞද්ධ, ක්‍රිස්තියානි, හින්දු හා ඉස්ලාම් ආගම්වල ශක්තිය ප්‍රයෝජනයට ගනිමින් අර්බුද සමථ මධ්‍යස්ථානයක් පිහිටු විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'10

17.
ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'10

18.
ගරු රවි කරුණානායක මහතා,— ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත්කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'10

19.
ගරු රවි කරුණානායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ලිංගික අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'10

20.
ගරු රවි කරුණානායක මහතා,— නව නිපැයුම්කරුවන් ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් සහ විවිධ දක්ෂතා ඇති පුරවැසියන් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'10

21.
ගරු රවි කරුණානායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'10

22.
ගරු රවි කරුණානායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'10

23.
ගරු රවී කරුණානායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'10

24.
ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'10

25.
ගරු රවී කරුණානායක මහතා,— පාසල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'10

26.
ගරු රවී කරුණානායක මහතා,— ක්‍රීඩා පාසල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'10

27.
ගරු රවී කරුණානායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 42/'10

28.
ගරු අජිත් කුමාර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අද ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අද ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අද ගොවීන්ට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 43/'10

29.
ගරු අජිත් කුමාර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශිලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක් ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 44/'10

30.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීම සඳහා නීති සම්පාදනය කිරීම,— රජයේ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ද, මහජනතාවට සියලු රාජ්‍ය තොරතුරු නිදහස්ව ලබා ගැනීමේ අයිතිය උදෙසා ද පාර්ලිමේන්තුව තුළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/'10

31.
ගරු රවී කරුණානායක මහතා,— ශ්‍රී ලාංකිකයින්ට වඩා යහපත් සෞඛ්‍ය අවස්ථාවන් සලසා දීම,— ජනතාවගෙන් විශාල පිරිසකට හදවත් සැත්කම් කිරීම අවශ්‍යව ඇති හෙයින්, ශ්‍රී ලාංකිකයන්ට වඩා හොඳ සෞඛ්‍ය අවස්ථාවන් සලසා දිය යුතු යැයි ද, ඒ සඳහා පෞද්ගලික අංශයේ සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදල හෝ සේවක භාරකාර අරමුදල හරහා නොමිලයේ පහසුකම් සලසා දිය යුතුයැයි ද, රජයේ සේවකයන් හෝ සේවා වියුක්තිකයන් සඳහා සම්පූර්ණ වියදම රජය විසින් ජනාධිපති අරමුදල හරහා සැපයිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/'10

32.
ගරු රවී කරුණානායක මහතා,— ලෝක පරිසරය ආරක්ෂා කිරීම,— ශ්‍රී ලංකාව, ලෝක පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි දැඩි අවධානය යොමු කළ යුතු අතරම ගෝලීය උණුසුම වැළැක්වීමට විශේෂයෙන් පියවර ගතයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/'10

33.
ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු විකාශනය කිරීම,— රූපවාහිනිය හෝ අන්තර්ජාලය හරහා පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු සජීවිව හෝ පරීක්ෂිතව විකාශනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/'10

34.
ගරු රවී කරුණානායක මහතා,— එතෙර ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දීම,— එතෙර ජීවත්වන ශ්‍රී ලාංකිකයන්ට ඉදිරි මැතිවරණ සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/'10

35.
ගරු රවී කරුණානායක මහතා,— විද්‍යුත් ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වාදීම,— යල්පැන ගිය වර්තමාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමය වෙනුවට විද්‍යුත් ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/'10

36.
ගරු අජිත් කුමාර මහතා,— ශ්‍රී ලංකාවේ වටිනා ස්වභාවික සම්පත් හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීම සඳහා විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේම වටිනා ස්වාභාවික සම්පත් ලෙස සැලකෙන සිංහරාජ වනාන්තරය, කන්නෙලිය රක්ෂිත වනාන්තරය, රුමස්සල කන්ද, කොග්ගල ඔය දූපත් හා කඩොලාන පද්ධතිය, රැම්සා තෙත් බිමක් වන මාදු ගඟ හා ඒ ආශ්‍රිත ප්‍රදේශ ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත් විධිමත් විද්‍යාත්මක සැලැස්මක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/'10

37.
ගරු අජිත් කුමාර මහතා,— ගාලු කොටුව හා ඒ ආශ්‍රිත ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම හා නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කිරීම,—

සංචාරක කර්මාන්තයේ ඉතා වැදගත් මධ්‍යස්ථානයක් වූ ද, ඓතිහාසික හා පුරා විද්‍යාත්මක වටිනාකමකින් යුතු වූ ද, ලෝක  උරුමයක් ලෙස සැලකෙන ගාලු කොටුපවුර, ගාලු කොටුව ඇතුළත හා ගාලු කොටුව ආශ්‍රිතව ඇති ඓතිහාසික හා පුරා විද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමටත්, ප්‍රවර්ධනය කිරීමටත්, ඒ හා සම්බන්ධ රාජ්‍ය ආයතන  හා ජන සහභාගීත්වය ඇතිව විධිමත් සැලැස්මක් ක්‍රියාත්මක කරමින් අප රටට මෙම ඓතිහාසික උරුමයේ නිසි ප්‍රයෝජන ලබා ගැනීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/'10

38.

ගරු තිලංග සුමතිපාල මහතා,— වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීම,—දේශීය හා ජාත්‍යන්තර වෛද්‍ය ක්‍රමය තුළ වෘත්තීමය සුදුසුකම් හා අත්දැකීම නොමැති වෛද්‍යවරුන් හා වෛද්‍යවරියන් ප්‍රතිකාර කිරීමෙහි යෙදී සිටීම තුළින් සාමාන්‍ය රෝගී ජනතාවට විශාල ගැටලු වලට මුහුණ පෑමට සිදුවීමෙන් අසරණ තත්ත්වයකට පත්ව ඇති හෙයින් ද, ඒ තුළින් වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින්නා වූ සුදුසුකම් ඇති වෛද්‍ය වෘත්තිකයන් සමාජය තුළ අවමානයට පත්ව ඇති හෙයින්ද, වෛද්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය වටිනාකම සුරැකීමට, ක්‍රමවත්ව හා විධිමත්ව නීත්‍යානුකූලව ක්‍රියාත්මක විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.55/'10

39.

ගරු තිලංග සුමතිපාල මහතා,— මාධ්‍ය නිදහස හා තොරතුරු දැනගැනීමේ අයිතිය තහවුරු කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළම තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කර ඇති හෙයින් ද, තාක්ෂණය දියුණු වෙමින් පවතින ලෝකයක සත්‍ය සැඟවීමට හෝ වසන් කිරීමට අවස්ථාවක් නොමැති හෙයින් ද,  ප්‍රජාතාන්ත්‍රික රටක සියලු පුරවැසියන්ට නිදහස් මාධ්‍ය තුළින් දැනුම හා අවබෝධය ලබාගැනීමේ අවකාශය ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.56/'10

40.

ගරු තිලංග සුමතිපාල මහතා,—ක්‍රීඩාව තුළින් නිරෝගීමත් සමාජයක් නිර්මාණය කිරීම,— ළමා අවධියේදීම දරුවන් ක්‍රීඩාවට යොමු කිරීම තුළින් නිරෝගීමත් සමාජයක් බිහිකිරීමටත්, සහජ කුසලතා ඇති දරුවන් ජාත්‍යන්තර තලයට යොමු කිරීමටත්, ලොව සුපතල ක්‍රීඩකයින් බිහි කර  රටට කීර්තියක් ලබා ගැනීමටත් හැකිවන පරිදි ජාති භේදයෙන් පන්ති භේදයෙන් තොරවූ සාධාරණ ක්‍රම වේදයක් රාජ්‍ය මට්ටමින් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.57/'10

41.

ගරු රවී කරුණානායක මහතා,— ඡන්ද හිමි නාම ලේඛනය  නිරතුරුව  යාවත්කාලීන කිරීම,— ඡන්ද හිමි නාම ලේඛනය මුළු වර්ෂයෙන්ම දින තිහක කාලයක් සඳහා පමණක් යාවත්කාලීන වන ලයිස්තුවක් නොව නිරතුරුවම යාවත් කාලීන වන විවෘත ලැයිස්තුවක් විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/'10

42.

ගරු රවී කරුණානායක මහතා,— විදේශ රැකියාවල නියුතු අය සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාදීම, —විදේශ ගතවී ඉතා අපහසුවෙන් උපයාගත් ධනය ශ්‍රී ලංකාවේ ධන සම්පත්තිය වැඩිකිරීම සඳහා එවන විදේශ රැකියාවල නියුතු අය ඇගයීම පිණිස විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා දීම සඳහා පියවර ගතයුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/'10

43.

ගරු රවී කරුණානායක මහතා,— 2009 මැයි 19 දිනට පෙර සේවයේ සිටි සන්නද්ධ සේනාවන් සඳහා  විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම,—පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වසර පහක සේවා කාලය සම්පූර්ණවූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට සුදුසුකම් ලබන බැවින් සන්නද්ධ සේනාවන්වල අවුරුදු 22 ක කාලය සම්පූර්ණ නොකළද 2009 වර්ෂයේ මැයි 19 වන දිනට පෙර ක්‍රියාකාරී සේවයේ යෙදී සිටි යුධ සෙබළුන්ට ද විශ්‍රාම වැටුප් ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/’10

44.
ගරු රවී කරුණානායක මහතා,— දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන් සඳහා විශේෂ සැලසුම් හඳුන්වාදීම,— නීතියේ සඳහන් වන පරිදි දුබල හා එහා මෙහා යා නොහැකි පුද්ගලයන්ගේ පහසුව තහවුරු කිරීමට හා ඔවුන් සතු ඵලදායීතාව වර්ධනය කිරීම සඳහාත් ඔවුන් අනවශ්‍ය ලෙස අනුන් මත යැපීම අවම කිරීම සඳහාත් සියලු නව රජයේ ගොඩනැගිලිවල විශේෂිත සැලසුම් ක්‍රමයක් ඇතිකළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/’10

45.
ගරු රවී කරුණානායක මහතා, — ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය තහවුරු කිරීම,— ලියාපදිංචිවූවද ඡන්දය ප්‍රකාශකිරීමට අවස්ථාව නොලැබුනු ඡන්දදායකයන් බොහෝ සංඛ්‍යාවක් සිටින බැවින් වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය ලබා දිය යුතු බව සහ ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන්වූ නමුත් ඡන්දය ප්‍රකාශ නොකරන පුද්ගලයන්ගෙන් දඩ මුදලක් අයකළ යුතුබව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/’10

46.
ගරු රවී කරුණානායක මහතා,— දූෂණයෙන් තොර ලෝකයක් තහවුරු කිරීම— දූෂණය මුලින් උපුටා දැමීම සඳහා ලෝකයේ පාර්ලිමේන්තු සංවිධාන සමඟ එක්වී ශ්‍රී ලාංකික පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කටයුතු කළ යුතු බවට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/’10

47.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කාදී අධිකරණ පද්ධතියට නිසි ස්ථානය ලබා දීම,— 1929 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත යටතේ කාදී අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ ස්ථාපිත කළ අතර ඉන් පසුව 1951 දී මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ සංශෝධනය කරන ලද එම ආඥාපනත මුස්ලිම් පවුල්වල පැනනගින ගැටලු පිළිබඳ සියළුම කාරණා සම්බන්ධ තීරණයන් ගැනීමට කාදී විනිශ්චකාරවරුන්ගේ බල තල වැඩිකළ යුතු අතර එම පද්ධතියේ ගෞරවයට නිසි තැන ලබා දෙමින් නඩු විභාග වාර නිසි පරිදි පැවැත්වීමට කාදී අධිකරණ පද්ධතියේ තත්ත්වය උසස් කළ යුතු බව සහ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කාදී විනිශ්චකාරවරුන් පත්කරන බැවින් සෙසු අධිකරණ නිලධාරීන් හට හිමි වන ගරුත්වය හා පිළිගත් වැටුප් තලය මත ස්ථාන ගත කළ යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 69/’10

48.
ගරු රවී කරුණානායක මහතා,— මුළාවට ලක්වූ තැන්පත්කරුවන්ට තම මුදල් නැවත ගෙවීම,— ව්‍යාජ මූල්‍ය ආයතනවල තම මුදල් තැන්පත්කර එමඟින් මුළාවට ලක්වූ බොහෝ දෙනෙක් සිටින බැවින් හා පසුගිය 2009/2010 මැතිවරණ ව්‍යාපාරයේදී මෙම රජය විසින් තැන්පත්කරුවන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ හිඟ මුදල් නැවත ගෙවීමට පොරොන්දුවී ඇති බැවින්, මහ බැංකුව මෙම ආයතනවල භාරකරු හෙයින් වඩා කාර්යක්ෂම ලෙස කටයුතු කළ යුතු බවත්, තැන්පත්කරුවන්ට තම හිඟ මුදල ලබා දීමට රජය ඉදිරිපත් විය යුතු බවත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 71/’10

49.
ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා සාමවිනිසුරු පත්වීම් ලබා දීම,— දේශීය ආයුර්වේද වෛද්‍යවරුන් මුදල් සහ වරප්‍රසාද අපේක්ෂාවෙන් තොරව ඔවුන්ගෙන් සමාජයට ඉටුවිය යුතු සමාජ වගකීමක් ලෙස සලකා විශේෂයෙන් ග්‍රාමීය ජනතාවට විශාල සේවාවක් ඉටු කරනු ලබන බැවින් එම සේවාවට ගරු කිරීමක් ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී ඇති සියළුම දෙනාට සාමවිනිසුරු පදවි ලබා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 72/'10

50.
ගරු බුද්ධික පතිරණ මහතා,— සාමවිනිසුරු තනතුරු ලබා දීමේ දී විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම,— මුළු මහත් සමාජයම පොදුවේ පිළිගනු ලබන සහ සමාජයට විශාල සේවාවක් සපයනු ලබන තනතුරක් වන සාමවිනිසුරු තනතුරු ලබා දීමේදී ඒ සඳහා සුදුසු නිර්නායක පදනම් කොට ගෙන එම තනතුරු ලබා නොදීම නිසා එම තනතුරෙහි ගෞරවය හා පොදු පිළිගැනීම ක්‍රමයෙන් හීන වන බැවින් ඒ සඳහා පොදුවේ පිළිගත හැකි නිර්නායක පදනම් කර ගන්නා වූ ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.74/'10

51.
ගරු බුද්ධික පතිරණ මහතා,— සුනාමි ඛේදවාචකයෙන් ඇතිවූ ගැටලු විසඳීම,— සුනාමි ඛේදවාචකය හේතුවෙන් කුමන හෝ ආකාරයේ ගැටලුවකට මුහුණ දී මේ වන තෙක් නොවිසඳී පවතින ගැටලු තිබේ නම්, ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කොට්ඨාස මට්ටමින් සොයා බලා ඔවුන් මුහුණ දී ඇති හා දැනටත් මුහුණ දෙනු ලබන ගැටලු අවම කිරීම සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.75/'10

52.
ගරු බුද්ධික පතිරණ මහතා,— ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ රැකියා උත්පාදන ක්ෂේත්‍ර තුළ විවිධ නිෂ්පාදන කටයුතු කරන දසලක්ෂයකට ආසන්න ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා දේශපාලන බල අධිකාරිය ඒ සඳහා සබැඳි සියලු ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයින්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි ද සහාය ලබා ගනිමින් විධිමත් ජාතික ප්‍රතිපත්තියක් සකස් කොට එය කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.76/'10

53.
ගරු බුද්ධික පතිරණ මහතා,—වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම් ඵලදායි කටයුතු සඳහා යොදා ගැනීම,—කුඹුරු ඉඩම් ගොඩකිරීමේ නීතිය උල්ලංඝනය නොවන පරිදි, විධිමත් අධ්‍යයනයකින් හඳුනා ගැනීමෙන් පසු කිසිසේත්ම වී වගා කළ නොහැකි කුඹුරු ඉඩම්වල ඵලදායි කෘෂි නිෂ්පාදන පමණක් වගා කිරීමටත් ,ඉදිකිරීම් කටයුතු සඳහා කිසිසේත්ම ඉඩ ප්‍රස්ථා නොලැබෙන ආකාරයේ වැඩසටහන් සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.77/'10

54.
ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සේවයේ විශ්‍රාමිකයින්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— 2006/6 වැටුප් ප්‍රතිශෝධන චක්‍ර ලේඛයට අනුව 2006.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රාජ්‍ය සේවකයන්ගේ වැටුප් පරිවර්තනය කිරීම නිසා 2006.06.01 දිනට පෙර විශ්‍රාම ගිය සහ ඉන්පසු විශ්‍රාම ගිය රාජ්‍ය සේවකයන් අතර දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින් එය ඉවත් කිරීමට ජාතික වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.78/'10

55.
ගරු බුද්ධික පතිරණ මහතා,— දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම,— භූගෝලීය පිහිටීම, ඓතිහාසික පසුබිම, වගාකරන භෝග වර්ග, මාර්ග පද්ධතිය, රජයේ කාර්යාල, පාසල්, විශ්වවිද්‍යාල, දුම්රිය ස්ථාන සහ බස් නැවතුම් පොළවල් ආදි සියලුම තොරතුරු පරිගණක ගත කරන ලද හා ලේඛන ගත කරන ලද තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීමටත්, එහි පළමු පියවරේදී පළාත් මට්ටමින්, දෙවැනි පියවර ලෙස දිස්ත්‍රික් මට්ටමින් සහ තෙවැනි පියවර ලෙස ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ මට්ටමින් මෙම මධ්‍යස්ථාන ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.79/'10

56.

ගරු බුද්ධික පතිරණ මහතා,—ශ්‍රී ලංකාවේ දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය විධිමත් කිරීම,— ශ්‍රී ලංකාවේ සියලුම ආගම්වල දහම් පාසල් අධ්‍යාපනය හා පරිපාලනය වඩාත් විධිමත් කිරීමට සහ බෞද්ධ දහම් පාසල් තුළ පවත්නා දහම් අවසාන හා ධර්මාචාර්ය විභාග මෙන්ම සියලුම ආගම්වල දහම් පාසල් තුළ පැවැත්වෙන ඒ හා සමාන විභාග සහතික පත්‍ර සඳහා නිසි පිළිගැනීමක් ලබා දීමට, දහම් පාසල් සඳහා අඛණ්ඩව මානව සම්පත් හා භෞතික සම්පත් ලබා දීමෙන් දහම් පාසල් සඳහා පැමිණෙන සිසුන් සංඛ්‍යාව වැඩි කිරීමට කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.80/'10

57.

ගරු බුද්ධික පතිරණ මහතා,—සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධ නීති සම්පාදනය,— නිවෙස්වල හෝ අලෙවි කිරීම සඳහා ඇති කරන සුනඛයින්, බළලුන් වැනි සුරතල් සතුන් පළාත් පාලන ආයතනවල ලියාපදිංචි කිරීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතු අතර, එම සතුන්ගේ පැටවුන් අලෙවි කිරීම නීත්‍යානුකූලව අවසර ලත් මධ්‍යස්ථානවලදී පමණක් සිදු කළ යුතු බවත්, එසේ නොවන ස්ථානවල ඇති කරන ගැහැණු සතුන් අනිවාර්යයෙන්ම වන්ධ්‍යාකරණයට ලක් කිරීමටත්, අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 81/'10

58.

ගරු බුද්ධික පතිරණ මහතා,— රැකියා වෙළඳපොළට අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීම—, අනාගත ශ්‍රී ලංකාවේ බිහිවන නව රැකියා අවස්ථා සඳහා අවශ්‍ය ශ්‍රමිකයින් පුහුණු කිරීමේ ක්‍රමවේදයකට මුල පිරීමේ කාර්යය වඩාත් කාර්යක්ෂම ලෙස රට තුළ පවත්නා සියලුම තෘතීක අධ්‍යාපන ආයතන මගින් ආරම්භ කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 82/'10

59.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීම,— දැනට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ග්‍රාම නිලධාරී වසම් යළි සීමා නිර්ණය කිරීම සඳහා කටයුතු කරගෙන යමින් සිටින බැවින් එසේ සීමා නිර්ණය කරනු ලබන ග්‍රාම නිලධාරී වසම් තුළින් නව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශ සීමා සහ නව දිස්ත්‍රික් සීමා නිර්ණය කළ යුතු බවත්, මෙසේ නිර්ණය කරනු ලබන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය පළාත් පාලන ආයතන බල ප්‍රදේශය බවට පත්කළ යුතු අතර එකී බල ප්‍රදේශයට කොට්ඨාස අධ්‍යාපන බල ප්‍රදේශය, පොලිස් බල ප්‍රදේශය, ගොවිජන සේවා බල ප්‍රදේශය, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී බල ප්‍රදේශය ඇතුළු සියලු රාජ්‍ය ආයතනයන්හි බල ප්‍රදේශ සීමා සංයුක්ත වන පරිදි සමස්ත රාජ්‍ය ව්‍යුහයම ප්‍රතිසංවිධානය විය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 83/'10

60.

ගරු බුද්ධික පතිරණ මහතා,— නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු යළි ආරම්භ කිරීම,— මාතර දිස්ත්‍රික්කයේ නිල්වලා ගඟ ව්‍යාපාරයේ සංවර්ධන කටයුතු අතර මග ඇන හිටීමෙන් එම මිටියාවතේ පෝෂක ප්‍රදේශයන්හි හව භෝග වගා කරන ජනතාවට මුහුණ පෑමට සිදුවී ඇති ගැටලු කඩිනමින් විසඳීමට පියවර ගත යුතු බවත්, නිල්වලා ගඟ ව්‍යාපාරයේ ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් යළි ආරම්භ කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 84/'10

61.

ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයිනගේ නිල කාලයට පසුද සාමවිනිසුරු පදවිය ලබාදීම,— පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින්ට දෙනු ලබන සාමවිනිසුරු තනතුරු ඔවුන්ගේ නිල කාලයට පමණක් සීමාවන බැවින්, නිල කාලයෙන් පසුවත් ඔවුන්ගෙන් එම සේවාව ලබා ගැනීම සඳහා පැමිණෙන විශාල පිරිසක් අපහසුතාවයට පත්වන බැවින්, එම මහජන නියෝජිතයන්ට තම නිල කාලයෙන් පසුවත්, සාම විනිසුරු තනතුරු ලබා දීම සඳහා සුදුසු වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 85/'10

62.
ගරු බුද්ධික පතිරණ මහතා,— සියළුම පළාත් සභා ජනතා නියෝජිතයන්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳව නැවත සලකා බැලීම,— දිවයිනේ දැනට ක්‍රියාත්මක වන පළාත් සභා හා ඉදිරියේදී විධිමත්ව ක්‍රියාත්මකවීමට නියමිත උතුරු පළාත් සභාවේ ගරු අමාත්‍යවරුන්, සභාපතිවරුන්, උපසභාපතිවරුන්, ආණ්ඩු පාර්ශ්වයේ සංවිධායකවරුන්, සභා නායකවරුන්, විරුද්ධ පාර්ශ්වයේ නායකවරුන්, විරුද්ධ පාර්ශවයේ ප්‍රධාන සංවිධායකවරුන් සහ ගරු මන්ත්‍රීවරුන්ගේ දීමනා, වරප්‍රසාද හා පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 86/'10

63.
ගරු බුද්ධික පතිරණ මහතා,— පළාත් පාලන ආයතන වල සියලුම මහජන නියෝජිතයින්ගේ දීමනා හා වරප්‍රසාද පිළිබඳ නැවත සලකා බැලීම,—දිවයිනේ ක්‍රියාත්මක වන හා ඉදිරියේදී ක්‍රියාත්මකවීමට නියමිත සියලුම මහ නගර සභා, නගර සභා හා ප්‍රාදේශීය සභාවන්හි පුරපතිවරයන්, නගරාධිපතිවරයන්, සභාපතිවරයන්, නියෝජ්‍ය පුරපතිවරයන්, නියෝජ්‍ය නගරාධිපතිවරයන්, උප සභාපතිවරුන්, විපක්ෂනායකවරයන් හා මන්ත්‍රීවරයන්ගේ දීමනා, වරප්‍රසාද සහ අනෙකුත් පහසුකම් ක්‍රමවත් තත්වයක නොපවතින බැවින් මේ පිළිබඳව ගැඹුරින් සලකා බලා ඒ සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.87/'10

64.
ගරු බුද්ධික පතිරණ මහතා,— උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වන විට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 88/'10

65.
ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම,— සියළුම දේශපාලන පක්ෂ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගෙන් සමන්විත විශේෂ කාරක සභාවක් පත්කොට ශ්‍රී ලංකාවට යෝග්‍යවූ ජාතික තරුණ ප්‍රතිපත්තියක් සකස් කිරීම ආරම්භ කළ යුතුයැයි ද, ඒ සඳහා ඒ හා සබැඳි සියලු ක්ෂේත්‍රයන් නියෝජනය වන පරිදි ප්‍රවීණයන්, උගතුන් හා බුද්ධිමතුන්ගෙන් මෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනයන්හි සහාය ලබා ගත යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 89/'10

66.
ගරු බුද්ධික පතිරණ මහතා,— රජයේ පාසල් හා විශ්වවිද්‍යාල නිවාඩු දිනවලදී එම මධ්‍යස්ථාන අධ්‍යාපන ඒකක සඳහා ලබාදීම,—රජයේ පාසල් නිවාඩු කාලයේදී සහ සවස් වරුවලත් විශ්වවිද්‍යාල නිවාඩු දිනවලත් එම මධ්‍යස්ථාන මූල් කොට ගෙන ව්‍යාපාරික ප්‍රජාව, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ මණ්ඩල, ප්‍රජා මූල සංවිධාන සම්බන්ධ කර ගන්නා වූ පුළුල් වැඩ පිළිවෙළක් වශයෙන් වැඩිහිටි හා නොවිධිමත් අධ්‍යාපන ඒකක සහනදායී ගාස්තු පදනමක් මත ආරම්භකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 90/'10

67.
ගරු බුද්ධික පතිරණ මහතා,— පුරප්පාඩු වන ග්‍රාම නිලධාරී තනතුරු වල වැඩ බැලීමේ පත්වීම් සඳහා කාර්යක්ෂම වැඩ පිළිවෙළක් සකස් කිරීම,— ග්‍රාම නිලධාරී තනතුරක පුරප්පාඩු ඇති වූ විට ආසන්න ග්‍රාම නිලධාරී වසමේ ග්‍රාම නිලධාරීවරයා වැඩ බැලීම සඳහා පත් කරනු ලබන්නේ ඉතා සුළු දීමනාවක් යටතේ බැවින් ද, මෙම වැඩ බැලීමේ පත්වීම් තුළින් ග්‍රාම නිලධාරී වසම් දෙකෙහිම කාර්යක්ෂමතාව බිඳ වැටෙන බැවින්ද, එම තත්වය මග හරවා ගැනීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම ග්‍රාම නිලධාරී සංචිතයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ පිහිටුවිය යුතු අතර පුරප්පාඩු සිදුවන වසම සඳහා එකී සංචිතය තුළින් ග්‍රාම නිලධාරීන් පත් කිරීම සහ එම සංචිතය තුළ සිටින ග්‍රාම නිලධාරීන්ට ප්‍රාදේශීය ලේකම් විසින් පවරනු ලබන

වෙනත් ඵලදායී ක්ෂේත්‍ර හෝ රාජකාරී සඳහා යෙදවීමේ වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 91/’10

68.

ගරු බුද්ධික පතිරණ මහතා,— වර්තමානයේ ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දීම,— සෑම ග්‍රාම නිලධාරී වසමකම පිහිටා ඇති ආගමික සිද්ධස්ථානයන්හි නායක ස්වාමීන්වහන්සේ, පූජකතුමා, විදුහල්පතිතුමා, ග්‍රාම නිලධාරී, සමෘද්ධි සංවර්ධන නිලධාරී, කෘෂිකර්ම පර්යේෂණ සහකාරවරයා, ජන සභා ලේකම්වරු, ප්‍රදේශයේ පොලිස් ස්ථානය නියෝජනය කරන නිලධාරියකු සහ එම ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ස්වේච්ඡා සංවිධාන, රාජ්‍ය හා පෞද්ගලික අංශ වල සේවය කරන අදාළ වසමේ පදිංචිව සිටින නියෝජිතයින්ගෙන් සමන්විත සිවිල් ආරක්ෂක කමිටු ගොඩනැගීමට වඩාත් පහසුවීම සඳහා වර්තමාන සිවිල් ආරක්ෂක කමිටුවලට නිල පිළිගැනීමක් ලබා දිය හැකි පරිදි පාර්ලිමේන්තු පනතක් සම්මත කළ යුතු යැයි ද, ඒ තුළින් ග්‍රාම නිලධාරී වසම තුළ සිදුවන අපරාධ හා දූරාචාර, නීති විරෝධී කටයුතු පිළිබද අදාළ අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීමට හැකි වන පරිදි අදාළ නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 92/’10

69.

ගරු බුද්ධික පතිරණ මහතා,— දිවයින තුළ දැනට ක්‍රියාත්මක වන යල් පැන ගිය නීති අණපනත් යාවත්කාලීන කිරීම,— ශ්‍රී ලංකාවේ මේ වනවිටත් අධිරාජ්‍යවාදී යුගයේදී හඳුන්වාදෙන ලද නීති අණපනත් ක්‍රියාත්මකවන බැවින් එම නීති අණපනත් යළි අධ්‍යනය කිරීමේ කමිටු පත්කර, යල් පැනගිය දඬුවම්, දඩ මුදල් ආදිය යාවත්කාලීන කිරීමේ ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 93/’10

70.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලු මැතිවරණ එකම දිනක පැවැත්වීම,— ශ්‍රී ලංකාව තුළ 1988 සිට 2010 දක්වා වසර 22 ක කාලය තුළ 1990, 1992, 1995, 1996, 1998, 2003 සහ 2007 වසරවලදී හැර අන් සෑම වසරකදීම කිසියම් මැතිවරණයක් පවත්වා ඇති අතර, එසේ මැතිවරණ පැවැත්වීම ජනතා මතය සලකා බැලීම සඳහා වටිනා නිර්ණායකයක් වුවද, මේ තුළින් රටේ ආර්ථිකය, පරිපාලනය ආදි සෑම ක්ෂේත්‍රයකටම දැඩි බලපෑමක් ඇති කරන බැවින් පළාත් පාලන මැතිවරණ, මහා මැතිවරණ සහ ජනාධිපතිවරණය එකම දිනයකදී පැවැත්වීමට හැකි වන පරිදි එකී ආයතනවල නිල කාලය සංශෝධනය කිරීමටත්, ගැලපෙන මැතිවරණ ක්‍රමවේදයක් නිර්මාණය කිරීමටත් සුදුසු පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 94/’10

71.

ගරු බුද්ධික පතිරණ මහතා,— පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට කටයුතු කිරීම,— රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව පාර්ලිමේන්තුව හා පළාත් සභා අතරත්, පළාත් සභා හා පළාත් පාලන ආයතන අතරත් මනා සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යාම අත්‍යාවශ්‍ය වන අතර ඒ සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන්, පළාත් සභා තුළ නියෝජනයවීම සහතිකවනු පිණිස ද, පළාත් සභා ප්‍රධානීන් පාර්ලිමේන්තුව තුළ නියෝජනය වීම සහතිකවනු පිණිසද ක්‍රමවේදයක් සකස් කිරීමට අවශ්‍ය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 95/’10

72.

ගරු බුද්ධික පතිරණ මහතා,— ජාතික ඒකාග්‍රතාව ඇති කිරීමට පියවර ගැනීම,— ජාතික ඒකාග්‍රතාවය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දෙමළ භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිංහල භාෂා පුහුණු වැඩ සටහන් ද, සිංහල භාෂාව කථා කරන ජනතාව ජීවත් වන ප්‍රදේශවල දෙමළ භාෂා පුහුණු වැඩසටහන් ද, රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික ආයතනයන්හි සහයෙන් ක්‍රියාත්මක විය යුතු අතර රාජ්‍ය හා පෞද්ගලික විද්‍යුත් මෙන්ම මුද්‍රිත මාධ්‍ය ආයතනවල සහයෝගය ලබාගනිමින් මෙම පුහුණු වැඩ සටහන් ආරම්භ කිරීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 96/'10

73.
ගරු බුද්ධික පතිරණ මහතා,— කලත්‍රයාගේ නොමනා ක්‍රියා නිසා අසරණභාවයට පත්වන පාර්ශවයට සහන සලසා දීම,— විවාහක අඹුසැමි යුවලක් එකම වහලක් යට ජීවත්ව සිටින අවස්ථාවලදී පුරුෂයා හෝ බිරිඳ සුරාව, සූදුව සහ වෙනත් අපචාරී කටයුතුවල යෙදෙමින් ඉඩම් හෝ ගේ දොර බඩු මුට්ටු තම පෞද්ගලික අභිමතය පරිදි විකුණමින් හෝ අන් අයට පවරමින් හැසිරීම නිසාවෙන් අනෙක් පාර්ශවයත් සමඟ දරුවන් දැඩි අසරණභාවයට පත් වන අවස්ථාවලදී එම තත්වය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය නීති සම්පාදනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/'10

74.
ගරු බුද්ධික පතිරණ මහතා,—චර්යා ධර්ම පිළිබඳ කාරක සභා ඇතිකිරීම,— ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විශ්වාසවන්තභාවය හා ඔවුන් තුළ උසස් ආචාර ධර්ම පවත්වාගෙන යාමේ අවශ්‍යතාව නිසා ඒ පිළිබඳ කරුණු සොයා බැලීම සඳහා චර්යා ධර්ම පිළිබඳ කාරක සභාවක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/'10

75.
ගරු බුද්ධික පතිරණ මහතා,—නව ඉලෙක්ට්‍රොනික් හැඳුනුම්පතක් නිකුත් කිරීම,— පරිපාලනය පහසු කිරීම, අපරාධ මැඩලීම සඳහා හා වෙනත් වංචනික ක්‍රියාවලට යොමුවීම අවමකිරීම සඳහා අදාළ පුද්ගලයාගේ රුධිර ගණය, බැංකු ගිණුම්, ක්‍රෙඩිට් කාඩ්, අධ්‍යාපන සුදුසුකම්, රියදුරු බලපත්‍ර හා විදේශ ගමන් බලපත්‍ර අංක ආදී වැදගත් හා අවශ්‍ය තොරතුරු ඇතුළත් නව ඉලෙක්ට්‍රොනික අංකයක් සහිත ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු බවත් ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයන්හි ජීවත්වන සියලු දෙනාගේ තොරතුරු ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් පරිගණකගත කිරීම කඩිනමින් කළ යුතු බවත් එම තොරතුරු වරින්වර යාවත්කාලීන කළයුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/'10

76.
ගරු බුද්ධික පතිරණ මහතා, — පොලිස් නිලධාරීන්ට ද අවුරුදු විස්සක සේවා කාලයකින් පසු විශ්‍රාම යාමට අවස්ථාව ලබාදීම, — පොලිස් දෙපාර්තුමේන්තුවේ කාන්තා පොලිස් නිලධාරිනියන් සඳහා වන විසි වසරක සේවා කාලයකින් පසු ස්ව කැමැත්තෙන් විශ්‍රාමයාමේ හැකියාව, පොලිස් නිලධාරීන් සඳහා ද අදාළ වියයුතු යැයි ද ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/'10

77.
ගරු බුද්ධික පතිරණ මහතා,—රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කිරීම ,—රෙගුලාසි තැනීම මෙන්ම රෙගුලාසි ඉවත් කිරීමද නිතර සිදුවන ක්‍රියාවලියක් බැවින් කල්පැන ගිය රෙගුලාසි ඉවත් කිරීම පිළිබඳ සොයා බැලීම සඳහා රෙගුලාසි ඉවත් කිරීමේ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/'10

78.
ගරු බුද්ධික පතිරණ මහතා, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන්/ නිලධාරිනියන් සේවයේ ස්ථිර කිරීම, — සිවිල් ආරක්ෂක බලකායට අයත් නිලධාරීන් හා නිලධාරිනියන් සඳහා ද රජයේ අනෙකුත් ආරක්ෂක අංශවල සේවයේ නියුතු නිලධාරීන් හා නිලධාරිනියන්ට මෙන් වැටුප්, දීමනා, ස්ථිර සේවය සහ විශ්‍රාම වැටුප් සහිත රජයේ වෙනත් දෙපාර්තුමේන්තුවල මෙන් පිළිගත් නිල තත්ත්වයක් ලබාදිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 103/'10

79.
ගරු බුද්ධික පතිරණ මහතා,—සහතික වීම පිළිබඳ කාරක සභා ඇති කිරීම,— පාර්ලිමේන්තුවේ අසන ප්‍රශ්නවලට පිළිතුරු වශයෙන් රජය දෙන සහතික හා රජයේ බැඳීම්

ඇතැම් විට කඩ වන අවස්ථා දක්නට ලැබෙන බැවින්, රජය සිය වගකීම් ඉටු කරන බවට සහ ඒවා පිළිබඳව වගකියන බවට සහතික වීම සඳහා සහතික වීම පිලිබඳ කාරක සභා ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 104/'10

80.

ගරු. (අල්හාජ්) ඒ.එච්.එම්. අස්වර් මහතා,— තල් ගස් වගාව දිරිමත් කිරීම,— "කට්පගතරු" යන නමින් හැඳින්වෙන පොදු ජනතාවට ඉමහත් ප්‍රයෝජනවත් වන තල් ගස් වගාව දිරිමත් කිරීමෙන් තල් ආශ්‍රිත නිෂ්පදන ප්‍රවර්ධනයට සියලු පියවර ගත යුතු බව මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 105/'10

81.

ගරු බුද්ධික පතිරණ මහතා, — දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඵලදායීතාව වැඩිකර ගැනීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු ඉඩම්වල ඇති අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් කඩිනමින් ඉවත්කර නීත්‍යානුකූල ඉදිකරීම් සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමෙන් දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම් වර්ධනය කළ යුතු අතර, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු සඳහා සෘජුවම බල නොපාන්නා වූ ඉඩම් දිගුකාලීන බදු පදනමක් මත පෞද්ගලික අංශයට ලබාදී එම මුදල් දුම්රිය පද්ධතිය නවීකරණය සඳහා යොදා ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.108/'10

82.

ගරු බුද්ධික පතිරණ මහතා,— යාචකයින්ගේ ජීවිත ආරක්ෂා කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— මේ වන විට යාචකයින්ගේ ජීවිතවලට විශාල ලෙස තර්ජන එල්ල වී තිබෙන බැවින් ඔවුන්ගේ ජීවිතවල සුරක්ෂිතතාව රැකදීම උදෙසා, ඔවුන්ට වගා කිරීම සඳහා ඉඩම් ලබා දී ඉන් ලැබෙන ආදායමෙන් ඔවුන්ගේ ජීවිතවල ආරක්ෂාව හා පෝෂණය සහතික කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.109/'10

83.

ගරු බුද්ධික පතිරණ මහතා,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීම සඳහා ක්‍රමවේදයක් සැකසීම,— අයාලේ යන සුනඛයින්ගෙන් මිනිස් ජීවිතවලට සිදුවන හානිය වළක්වා ගැනීමේ අරමුණින්, රජය මගින් භූමි ප්‍රමාණයක් වෙන්කොට එම ස්ථානයට නිදැල්ලේ යන සුනඛයින් ගෙන ගොස් ඔවුන් රැක බලාගැනීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.110/'10

84.

ගරු බුද්ධික පතිරණ මහතා,— ළමා අපචාර සිද්ධීන් සඳහා දැඩි දඬුවම් පැනවීම,— දිවයින පුරා ළමා අපචාර හා අපයෝජනයන් දිනෙන් දින සීඝ්‍රයෙන් වර්ධනය වීමේ තත්ත්වයක් ඇති වී තිබෙන බැවින් ඒ සම්බන්ධව දැනට පවත්නා නීති රෙගුලාසි ප්‍රමාණවත් නොවන්නේ නම්, නව නීති රෙගුලාසි අලුතින් සම්මත කොට ඉතා කඩිනමින් මේ සම්බන්ධ නඩු විසඳීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.111/'10

85.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙරළ පිවිසුම් මාර්ග ඇති කිරීම,— දිවයිනේ වෙරළබඩ කලාපය තුළ සීඝ්‍රයෙන් සිදුවන ඉදිකිරීම් නිසාවෙන් දේශීය, විදේශීය සංචාරකයන්ට මෙන්ම ධීවරයන්ට ද වෙරළ තීරයට පිවිසීමේදී අවහිරතා ඇතිව තිබීම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනයට මෙන්ම ධීවර කර්මාන්තයට ද බාධා ගෙන දෙන බැවින් එම තත්ත්වය වළක්වාලීම සඳහා මෙන්ම මෙම ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වෙරළ පිවිසුම් මාර්ග පද්ධතියක් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.112/'10

86.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම,— විදුහල්පති සේවය, ගුරු අධ්‍යාපන සේවය, අධ්‍යාපන පරිපාලන සේවය යන සේවාවල දැඩි වැටුප් විෂමතාවක් පවතින බැවින්, එම තත්ත්වය මහ හරවා ඔවුන්ගේ ආත්මාභිමානයට සරිලන වැටුපක් ලැබෙන පරිදි වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.113/'10

87.

ගරු බුද්ධික පතිරණ මහතා,— බෞද්ධ භික්ෂු අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,— බෞද්ධ භික්ෂූන්වහන්සේලාගේ ධර්ම ඥානය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව උන්වහන්සේලාගේ කථන හැකියා, ශ්‍රවණ හැකියා, පරිගණක, මනෝවිද්‍යාත්මක සහ උපදේශනය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම උදෙසා දැනට පවත්නා භික්ෂු අධ්‍යාපන ආයතනවලට පරිබාහිරව මෙම කටයුතු සඳහාම වෙන් වූ භික්ෂු අධ්‍යාපන ආයතන ඇති කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.114/'10

88.

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන නොතාරිස් සේවාව යාවත්කාලීන කිරීම,— දිවයින තුළ ක්‍රියාත්මක වන නොතාරිස් සේවය යල්පැන ගිය නීතිවලින් සකස් වී ඇති නිසා ඒ පිළිබඳව යළි සලකා බලා වර්තමානයට ගැලපෙන ලෙස නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.115/'10

89.

ගරු බුද්ධික පතිරණ මහතා,— වියළි කලාපීය හේන් ගොවීන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වියළි කලාපීය ප්‍රදේශවල හේන් ගොවීන් විසින් වගා කරනු ලබන වී, කුරක්කන්, මුං, තල වැනි වගාවන්හි අස්වැන්න වැඩි කර ගැනීම සහ නිෂ්පාදන සකස් කිරීම සඳහා නව තාක්ෂණය හඳුන්වාදීම තුළින් උසස් ගුණාත්මක තත්ත්වයෙන් යුතු නිෂ්පාදන සකස් කිරීම සඳහාත්, දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තුළ නිෂ්පාදන අලෙවි කර ගැනීමේ පදනම ශක්තිමත් කර ගැනීම සඳහාත් සීමිත සමූපකාර සමාගම් ඇති කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.116/'10

90.

ගරු බුද්ධික පතිරණ මහතා,— ගුරු උපදේශක සේවාවක් ඇති කිරීම,— ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව මීට වසර විස්සකට(20) පමණ පෙර සිට ආරම්භ වී ක්‍රියාත්මක වන ගුරු උපදේශක තනතුරු වෙනම ගුරු උපදේශක සේවා ඒකකයක් ලෙස ස්ථාපනය කල යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.117/'10

91.

ගරු රුවන් රණතුංග මහතා,— අතුරු බෙදීම් තහනම් නිකුත්කර ඇති රජයේ දීමනා පත්‍ර ඉඩම්වල අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීම,— ජය භූමි, ස්වර්ණ භූමි, රත්න භූමි ආදී රජයේ ඉඩම් දීමනා පත්‍රලාභීන්ගේ ඉඩම්වල අතුරු බෙදීම් තහනම් වුවත්, මුල් ඉඩම්ලාභීන්ගේ දෙවන පරම්පරාවේ අයිතිය තහවුරු කිරීමටත්, ඔවුන්ගේ ගේ දොර වතුපිටිවල සංවර්ධන කටයුතු කිරීමටත් අතුරු බෙදීම් අවශ්‍යතා පැන නැගුණු විට, පළාත් කොමසාරිස්, ඉඩම් කොමසාරිස් සහ ජනාධිපති ලේකම් කාර්යාලය හරහා දැනට ක්‍රියාත්මක වන දීර්ඝ ක්‍රියාවලිය අවම කොට අතුරු බෙදීමේ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ට පැවරීමට අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.118/'10

92.

ගරු බුද්ධික පතිරණ මහතා,— තිරිඟු පිටි වෙනුවට සහල් පිටි ජනතාව අතර ජනප්‍රිය කරවීම සඳහා නව තාක්ෂණය හඳුන්වා දීම,— තිරිඟු පිටි සඳහා විදේශ රටවලට ඇදී යන විශාල ධනස්කන්ධය නවතාලීමේ අරමුණ ඇතිව ආදේශකයක් ලෙස භාවිතා කළ හැකි සහල් පිටිවලින් සැකසූ ආහාර ප්‍රචලිත කිරීම සඳහාත්, කෙඳි සහිත ධාන්‍ය වර්ගයක් වන සහල් වඩාත් සියුම් ලෙස තිරිඟු පිටි මෙන් අඹරා ගැනීම සඳහාත්, තිරිඟු පිටි ඇඹරීමට භාවිතා කරන ආකාරයේ යන්ත්‍ර සූත්‍ර සහ නව තාක්ෂණය හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.119/'10

93.

ගරු බුද්ධික පතිරණ මහතා,— යුද්ධය නිසා ආබාධිතයන් බවට පත්වූවන්ට සහන සලසා දීම,— වසර 30කට ආසන්න කාලයක් පැවැති යුද්ධය හේතුකොට ගෙන එදිනෙදා කුලී වැඩ කොට ජීවත් වූ ජනතාවත් ස්ථිර රැකී රක්ෂා කළ ජනතාවත් අතුරින් සැලකිය යුතු ප්‍රමාණයක් අංගවිකලව ආබාධිතව ජීවන බරින් මහත් පීඩාවට පත් වී අසරණව ජීවත් වන බැවින්, ඔවුන් සඳහා යම් මාසික දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.120/'10

94.

ගරු බුද්ධික පතිරණ මහතා,— සියලුම ප්‍රභූ ආරක්ෂකයින් සඳහා ගමන් වියදම් දීමනාවක් ලබා දීම,— ජනාධිපති ආරක්ෂක සහ අගමැති ආරක්ෂක සේවයේ නියුක්ත නිලධාරීන්ට මෙන්ම අනෙකුත් ප්‍රභූ ආරක්ෂක සේවාවල නියුක්ත නිලධාරීන්ට ද සමාන ගමන් වියදම් දීමනාවක් ලබා දීමට කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.122/'11

95.

ගරු රුවන් රණතුංග මහතා,— රාජ්‍ය බැංකුවල පොලී ගෙවීම සහ පොලී අයකිරීම අතර පවතින පරතරය අඩු කිරීම,— රාජ්‍ය බැංකුවල සාමාන්‍ය ඉතුරුම් තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 4 % සිට 4.5 % දක්වාද ස්ථාවර තැන්පතු සඳහා ගෙවන පොලී අනුපාතය 8 % පමණ ද වන අතර බැංකු විසින් නිවාස, ව්‍යාපාරික සහ කෘෂිකාර්මික වැනි ණය සඳහා අය කරනු ලබන පොලී අනුපාතය 12 % සිට 13 % ක් ද පමණ වන බැවින් ජනතාවට සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයන්ට අතදීම සඳහාත් ඔවුන් දිරිගැන්වීම සඳහාත් මෙම අයකරන පොලිය සහ ගෙවන පොලිය අතර පවතින පරතරය අඩුකිරීමට පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.123/'11

96.

ගරු රුවන් රණතුංග මහතා,— උපාධිධාරී ග්‍රාම නිලධාරීන් අගැයීම සඳහා දීමනාවක් ලබා දීම,— රාජ්‍ය සේවය ගම් මට්ටමින් ජනතාවට ලබා දීම සඳහා සේවය කරන ග්‍රාම නිලධාරීන් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් පසුව තරඟ විභාග ලකුණු මත බඳවා ගෙන ඇතත්, දැනට සේවයේ යෙදී සිටින ග්‍රාම නිලධාරීන් අතුරින් 30 % ක් 40 % ක් පමණ පිරිසක් උපාධි සුදුසුකම් ලබා ඇති අතර එයට කිසිදු සැලකිල්ලක් මෙතෙක් දක්වා නැති බැවින් උපාධි සුදුසුකම අගැයීම සඳහා උපාධිධාරී ග්‍රාම නිලධාරීන්ට වැටුප් වැඩිවීමක් හෝ දීමනාවක් ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.124/'11

97.

ගරු රුවන් රණතුංග මහතා,— ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත් සහ වාර සඟරාවල බුද්ධ රූපය පළ කිරීම තහනම් කිරීම,— දෛනික පුවත්පත්වල සහ වාර සඟරාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප කිසිදු පාලනයකින් තොරව අසීමිතව මුද්‍රණය කෙරෙන අතර එම පත්‍රිකා විවිධ භාණ්ඩ දවටන සහ වෙනත් අයෝග්‍ය කටයුතු සඳහා භාවිතා කිරීම බුදුරජාණන්වහන්සේට අගෞරවයක් වන බැවින් 2600 වැනි සම්බුද්ධ ජයන්තිය සැමරීම ද සැලකිල්ලට ගෙන මින් ඉදිරියට ශාස්ත්‍රීය ග්‍රන්ථවල හැර දෛනික පුවත්පත්, වාර සඟරා සහ

වෙනත් පත්‍රිකාවල බුද්ධ රූප සහ ප්‍රතිමා රූප පළ කිරීම තහනම් කිරීම සඳහා අවශ්‍ය නීති හඳුන්වා දිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.126/'11

98.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" ස්ථාපනය කිරීම,— ත්‍රිභාෂා ශ්‍රී ලංකාවක් සඳහා වන දස අවුරුදු ජාතික සැලැස්මක් ඇති කිරීම ජාතික ඒකාබද්ධතාව සහ සමාජ සංහිඳියාව සඳහා ඉතා වැදගත් ක්‍රියා මාර්ගයක් බැවින්, කෙටි කාලීන නිරාවරණ වැඩ සටහන් යටතේ ශිෂ්‍යයන් සහ ගුරුවරුන් හුවමාරුව සඳහා "සහෝදර පාසල් වැඩසටහනක්" මගින් බහුතරයක් සිංහල භාෂාව කථා කරන ප්‍රදේශවල තිබෙන එක් එක් පාසල්, දෙමළ මාධ්‍ය පාසල් සමග සම්බන්ධ කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය සහ ජාතික භාෂා සහ සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.127/'11

99.
ගරු රවී කරුණානායක මහතා,— ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය නැවත නම් කිරීම,— නිදහස් අධ්‍යාපනයේ පියා වන දිවංගත ගරු (ආචාර්ය) සී. ඩබ්ලිව්. ඩබ්ලිව්. කන්නන්ගර මහතාට ගෞරවයක් වශයෙන් ගාල්ල ජාත්‍යන්තර ක්‍රීඩාංගණය එතුමාගේ නමින් නැවත නම් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.128/'11

100.
ගරු අජිත් කුමාර මහතා,— පූර්ව ළමා විය අධ්‍යාපනය පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කිරීම,— අප රට තුළ දරුවන්ගේ අධ්‍යාපනයේ ඉතා වැදගත් අවස්ථාවක් වන පූර්ව ළමා විය අධ්‍යාපනය ලබා දීම (පෙර පාසල් අධ්‍යාපනය) පිළිබඳව ජාතික වැඩපිළිවෙළක් සකස් කළ යුතු අතර පෙර පාසල් පාලිකාවන්ට විධිමත් පුහුණුවක් හා බඳවා ගැනීමේ ක්‍රමයක් සමගින් වැටුප් ක්‍රමයක් ද සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.129/'11

101.
ගරු අජිත් කුමාර මහතා,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික ස්ථාන පිළිබඳ නිබන්ධනයක් සකස් කිරීම,— ගාල්ල දිස්ත්‍රික්කයේ ඓතිහාසික, පුරා විද්‍යාත්මක හා සංස්කෘතිකමය වශයෙන් වටිනා ස්ථාන සම්බන්ධයෙන් පුළුල් අධ්‍යයනයක් සිදුකර ඒ පිළිබඳව ශාස්ත්‍රීය වශයෙන් වටිනාකමක් ඇති නිබන්ධනයක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.130/'11

102.
ගරු රවී කරුණානායක මහතා,— මැතිවරණ ක්‍රියාවලිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම,— මැතිවරණ ක්‍රියා පටිපාටිය සහ මැතිවරණ පැවැත්වීම පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් ස්ථිර පදනමකින් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.131/'11

103.
ගරු රවී කරුණානායක මහතා,— සේවක අර්ථසාධක අරමුදලින් සහ සේවක භාරකාර අරමුදලින් කඩිනමින් මුදල් ගෙවීම,— සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වය දරන සියලුම සාමාජිකයින්ට ගෙවිය යුතු මුදල් ක්‍රියාකාරී සේවයෙන් විශ්‍රාම ගෙන එක් මසක් ගතවීමෙන් අනතුරුව ගෙවීම සඳහා විධිවිධාන සැළසිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.132/'11

104.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය මාධ්‍යවල අපක්ෂපාතීත්වය තහවුරු කිරීම,— රාජ්‍ය මාධ්‍ය ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට පමණක්ම හිමි වූ තනි අයිතිවාසිකමක්වන නිසාත්, රජයේ මාධ්‍ය නිරන්තරවම දේශපාලනීකරණයට ලක්වීමක් සිදුවී තිබෙන නිසාත් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටින සියලුම දේශපාලන පක්ෂවලට රාජ්‍ය මාධ්‍ය තුළින් සමාන ලෙස සැලකීම සහ සමාන ලෙස අවස්ථාවන් ලබාදීම තහවුරු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.133/'11

105.
ගරු රවී කරුණානායක මහතා,— රාජ්‍ය සේවයේ භාෂා ප්‍රවීණත්වයේ අවශ්‍යතාව,— වර්ෂ 2025 වන විට සියලුම රජයේ සේවකයන්ට සිංහළ, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම වැඩ කටයුතු කිරීමට, ලිපි හුවමාරු කර ගැනීමට සහ කථා කිරීමට හැකි වීම රජය විසින් අනිවාර්ය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.134/'11

106.
ගරු රවී කරුණානායක මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විමධ්‍යගත අයවැයෙන් ප්‍රතිපාදන වෙන්කරදීම,— පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනා වෙත, දළ ජාතික නිෂ්පාදිතයෙන් 1% කට සමාන වූ විමධ්‍යගත අයවැය මුදලක් වාර්ෂිකව වෙන්කළ යුතු බවත් එම වෙන්කිරීමෙන්, 50% ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් උපයෝගීකර ගැනීමටත් ශේෂය රජයේ නිර්ණායක මත පදනම්ව තම ඡන්ද දායකයින් වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ අභිමතය පරිදි කවර හෝ පදනමකින් උපයෝගී කර ගැනීම සඳහාත් හිමිකම් ලබා දිය යුතු බවත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.138/'11

107.
ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන පාඨමාලාවන් රැකියාභිමුඛ පාඨමාලාවන් බවට පත්කිරීම,— දිවයිනේ සියලුම රජයේ විශ්වවිද්‍යාල සහ පෞද්ගලික විශ්වවිද්‍යාල මගින් පවත්වාගෙන යන ශාස්ත්‍රීය අධ්‍යාපනයම සඳහා වූ උපාධි පාඨමාලාවන් රැකියාභිමුඛ වෘත්තීයමය උපාධි පාඨමාලාවන් බවට පරිවර්තනය කර එමගින් බිහිවන්නා වූ උපාධිධාරීන් වෙත නව රැකියා සපයා දීමේ අරමුණ ඇතිව, සියලුම විශ්වවිද්‍යාල සමඟ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන සම්බන්ධීකරණය සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.139/'11

108.
ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් සිසුන් ප්‍රවාහනය කරනු ලබන වෑන් රථ සඳහා නිසි ප්‍රමිතීන් නියම කිරීම,— දිවයින පුරා පවත්වාගෙන යනු ලබන පාසල් සිසු ප්‍රවාහන සේවාවන් නියමිත ප්‍රමිතියෙන් නොපවතින බැවින් සහ ඇතැම් පාසල් වෑන් රථ සේවකයින්ගේ පැවතුම් යහපත් තත්ත්වයෙන් නොපවතින බැවින්, නිසි ප්‍රමිතියෙන් යුතු වෑන් රථ සේවාවක් පවත්වාගෙන යෑම සඳහාත්, එම සේවාවන් ලබාගන්නා පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, වෑන් රථ සේවාවන් සඳහා ප්‍රමිතීන් හඳුන්වාදිය යුතුයැයි ද, වෑන් රථ සේවකයින් තුළ යහපත් පැවතුම් පවත්වාගෙන යාම සඳහා විනය නීති මාලාවක් හඳුන්වා දිය යුතුයැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.140/'11

109.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පොල් කර්මාන්තයෙහි සහ පොල් සම්පත්වල සංවර්ධනය හා ප්‍රවර්ධනය විධිමත් කිරීම,— වානිජමය නිෂ්පාදන අතර ඉතා වැදගත් ස්ථානයක් පොල්වලට හිමි වන හෙයින් පොල් සම්පත් සහ ඒවායේ පරිසරය තිරසාරව පවත්වා ගන්නා අතරම දළ දේශීය නිෂ්පාදිතයට සුවිශේෂී දායකත්වයක් ලබා දෙන ලෙස පොල් කර්මාන්තය සහ පොල් සම්පත්වල සංවර්ධනය විධිමත් කොට ප්‍රවර්ධනය කිරීම උදෙසා අර්ථාන්විත පියවර ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.141/'11

110.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කිතුල් කර්මාන්තය නගා සිටුවීම උදෙසා කිතුල් වගා කිරීම වැඩි කිරීම,— ග්‍රාමීය කර්මාන්ත කෙරෙහි කිතුල් මගින් සිදු කරනා සුවිශාල දායකත්වය හේතු කොට ගෙන ග්‍රාමීය කර්මාන්ත සහ ග්‍රාමීය ප්‍රජාව නගා සිටුවීම පිණිස වගාවන්

තුළ කිතුල් ගහනය වැඩි කිරීම සඳහා වන අපගේ දිරිය සැලසුමට අනුගතව නව කිතුල් වගාවන් සංඛ්‍යාව වැඩි කිරීම උදෙසා නිසි ක්‍රියාමාර්ග ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.142/'11

111.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් සුරක්ෂිත කිරීම,— තිරසාර ජාතික සංවර්ධනයක් සහ ස්වකීය ජනතාවගේ සහ ආර්ථිකයේ යහ පැවැත්ම උදෙසා, වසර 2020 වන විට ශ්‍රී ලංකාව වටා දූෂණයෙන් තොර සමුද්‍රික පරිසරයක් තහවුරු කිරීම පිණිස පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.143/'11

112.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කිරීම— කජු සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සැකැසුම, අලෙවි කිරීම සහ වගා කිරීමට ආධාර කිරීම සහ එමගින් ප්‍රධාන පෙළේ, තත්වයෙන් උසස් සහ වටිනාකම එකතු කළ කජු නිෂ්පාදකයකු සහ අපනයනකරුවකු බවට පත්වීම සඳහා ශ්‍රී ලංකාවට සහාය ලබා දීම පිණිස කජු වගාව වැඩි දියුණු කිරීම උදෙසා කටයුතු ආරම්භ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.144/'11

113.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— සම්ප්‍රදායික කර්මාන්ත සංවර්ධනය කිරීම,— අම්පාර දිස්ත්‍රික්කයේ අභාවයට යන සම්ප්‍රදායික කර්මාන්ත වන අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය, කුඹල් කර්මාන්තය, තල් කොළ හා පන් ගස්වලින් පෙට්ටි, වට්ටි හා පැදුරු විවීම, කොහු කර්මාන්තය හා වේවැල් කර්මාන්තය යනාදිය සංවර්ධනය කර, එම ප්‍රදේශයේ ජනතාවට රැකියා අවස්ථාවන් උදාකර දීමෙන් ඔවුන්ගේ ආදායම නංවාලීමට රජය කටයුතු කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.146/'11

114.

ගරු තිලංග සුමතිපාල මහතා,— ආයුධ වෙළඳාම සඳහා විධිමත් පාලන ක්‍රමයක් ස්ථාපිත කිරීම,—ජාත්‍යන්තර වශයෙන්, කිසිදු පාලනයකින් තොරව ආයුධ වෙළඳාම ක්‍රියාත්මක වීමේ ප්‍රතිඵලයක් ලෙස  ශ්‍රී ලංකාව වැනි රටවලට ආයුධ ගලා ඒම සහ එම රටවල් තුළ අවිධිමත් ලෙස ආයුධ සංසරණයවීම, ජනසමාජයේ නිදහසට ඉමහත් බාධකයක් ද ප්‍රජාතන්ත්‍රවාදී ලෙස බලයට පත් රජයකට තර්ජනයක් හා බලපෑමක් මෙන්ම රට තුළ මත්ද්‍රව්‍ය සහ ගණිකා වෘත්තිය වැනි නීති විරෝධී ක්‍රියාකාරකම් පුළුල් වීම සඳහා හේතුවක්ද වී ඇත. ඉහත තත්ත්වය වළක්වාලමින් විනයගරුක, නීතිගරුක සහ සදාචාර සම්පන්න සමාජයක් ජනිත කිරීම මහින්ද චින්තන ඉදිරි දැක්මෙහි අපේක්ෂාවක් වන බැවින් ද, වර්තමාන ලෝකයේ බලාපොරොත්තුව අවි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම මගින් සමාජ අරගල අවම කර සමාජ සුභ සාධනය සහතික කිරීම වන බැවින් ද, මෙම විෂමාචාරයන් පිටුදැකීම සඳහා ජාත්‍යන්තර ගිවිසුම්වලට හා ප්‍රඥප්තිවලට අදාළව දේශීය නීති පද්ධතියක් ස්ථාපිත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.147/'11

115.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— රට ඉඳි වගාව හඳුන්වාදීමේ හැකියාව විමසා බැලීම සඳහා පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම,— රට ඉඳි ශාඛය (ෆීනික්ස් ඩැක්ටිලිෆෙරා) අප රටේ වගා කිරීම සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ කාත්තන්කුඩිහි සිදු කරන ලද අත්හදා බැලීමක් සාර්ථක බව පෙනී ගොස් ඇති හෙයින්, අප රටේ ජනතාවට අපේම පොළවේ වවන ලද මෙම රසවත් පළතුර භුක්ති විඳීමට අවස්ථාව සලසනු පිණිස, රට ඉඳි වගාව හඳුන්වා දීමේ හැකියාව විමසා බලන පුළුල් අධ්‍යයනයක් සිදු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*116.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල සහ 2010 සැප්තැම්බර් මස 23 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, "ශීඝ්‍රයෙන් ඉහළ යන රථවාහන අනතුරු පිළිබඳව කරුණු විමර්ශනය කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව" සාමාජිකයන් විසිපස් දෙනෙකුට (25) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

*117.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*118.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*119.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*120.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*121.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*122.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජුලි 27 දිනැති අංක 1716/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*123.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*124.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*125.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— "2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය."
යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*126.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

127.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

128.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

129.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**